දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
**SUWASIRIPAYA**
සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
**Ministry of Health**

මගේ අංකය )
எனது இல ) **CF/EXI/08/2020**
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) **2020.12.10**
Date )

**පොදු චක්‍රලේඛ ලිපි අංක : 02-101/2020**

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ජාතික රෝහල
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
ජේඛීය අමාත්‍යාංශය යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
අදාල ආයතන ප්‍රධානීන් වෙත

**<u>හෙද සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2020 (2 වාරය)</u>**

III ශ්‍රේණියේ හෙද නිලධාරීන් සඳහා අනුමත වැටුප් ක්‍රමයේ හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර මුල් පත්වීමේ දින සිට වසර 03ක් ගතවීමට පෙර සමත්වියයුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය **2021/02/21** දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

**02 සුදුසුකම්**

අංක 1837/8 හා 2013.11.19 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද සංශෝධිත හෙද සේවා ව්‍යවස්ථාවේ සඳහන් III ශ්‍රේණිය යටතේ වර්ග කරනු ලැබූ, මෙතෙක් මෙම විභාගය සම්පූර්ණකර නොමැති හෙද/හෙදි නිලධාරීන් සහ මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනීසිට, ආයතන සංග්‍රහය හෝ මුදල් රෙගුලාසි විෂයයන් අසමත් නිලධාරීන්ට මෙම විභාගය සඳහා අයදුම් කළහැකිය.

**03 අයදුම්පත්**

මෙම චක්‍රලේඛය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගන්නා අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින් කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385, සෞඛ්‍ය අමාත්‍යාංශය, අධ්‍යක්ෂ (විභාග) වෙත **2021/01/12** දින හෝ ඊට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කළ යුතුය. තම අයදුම්පත සමඟ රාජකාරී ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු.**45.00** ක් වටිනා මුද්දර ඇලවූ 9"× 4" ප්‍රමාණයේ ලියුම් කවර 02 ක් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත අයදුම්පත්ද නැවත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සැලකිය යුතුයි : ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය $A_4$ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පළමු පිටුවේ අංක 01 සිට 04 දක්වාත් දෙවන පිටුවේ අංක 05 සිට 10 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**04 විභාග ගාස්තු**

I විභාගයට පළමුවන වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. මීට පෙර අයදුම් කළද, විභාගයට පෙනී නොසිටි අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු 25/- බැගින් අවලංගු නොකල මුද්දර අයදුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා ඒවා නිසි ලෙස අවලංගු කළ යුතුය.

II කිසිදු කරුණක් මත ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ.

**05 විභාගයට ඇතුලත් කරගැනීම.**

I නිසි පරිදි සම්පූර්ණකර ඇති අයදුම්පත් සඳහා අපේක්ෂකයින්ට/ අපේක්ෂිකාවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණකර ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

II විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළයුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළයුතුය.

(අ) ජාතික හැඳුනුම්පත්‍රය

(ආ) සෞඛ්‍ය අමාත්‍යංශයේ හෝ ඊට අදාල ආයතනයක් මඟින් විධිමත් ලෙස නිකුත් කරන ලද හැඳුනුම්පත

(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

**06 විභාග පරිපාටිය**

මෙම විභාගය **ආයතන සංග්‍රහය** සහ **මුදල් රෙගුලාසි** යනුවෙන් ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විතය. එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා ලකුණු 100 ක් බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය. එක් වරකදී හෝ කිහිපවරකදී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. නිලධාරීන් විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේ දී අදාල සියලුම විෂයන්ට අයදුම් කළ යුතුය.

**07 විෂය නිර්දේශය**

**කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

**07.01 ආයතන සංග්‍රහය ප්‍රශ්න පත්‍රය**

**මෙම ප්‍රශ්න පත්‍රය රචනාමය ප්‍රශ්න පත්‍රයක් වන අතර ප්‍රශ්න 08 කින් ඕනෑම ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය 03 කි.**

**විෂය නිර්දේශය**

| | | | |
|---|---|---|---|
| II | වන පරිච්ඡේදය | - | සේවයට බඳවා ගැනීමේ කාර්ය පරිපාටි හා පත්කිරීම් |
| III | වන පරිච්ඡේදය | - | මාරු කිරීම් |
| VII | වන පරිච්ඡේදය | - | වැටුප් |
| VIII | වන පරිච්ඡේදය | - | අතිකාල දීමනා නිවාඩු දවස් හා නිවාඩු දවස් සඳහා වැටුප් හා දීමනා |
| XII | වන පරිච්ඡේදය | - | නිවාඩු |
| XIII | වන පරිච්ඡේදය | - | දුම්රිය බලපත්‍ර |
| XVII | වන පරිච්ඡේදය | - | අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර |
| XXII | වන පරිච්ඡේදය | - | ගෘහ සාධක පහසුකම් |
| XXV | වන පරිච්ඡේදය | - | වෘත්තීය සංගම්වල සාමාජිකයන්ට අනුග්‍රහ |

07.02 **මුදල් රෙගුලාසි ප්‍රශ්න පත්‍රය**

**මෙම ප්‍රශ්න පත්‍රය රචනාමය ප්‍රශ්න පත්‍රයක් වන අතර ප්‍රශ්න 08 කින් ඕනෑම ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය 03 කි.**

**විෂය නිර්දේශය**

මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ 1 සිට මු.රෙ 157 දක්වා කරුණු පිළිබඳව පරීක්ෂා කරනු ලැබේ.

08. **විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම**

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ බලා උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

09. කරුණාකර මෙම චක්‍රලේඛයේ අඩංගු දෑ ඔබ ආයතනයේ සේවයේ නියුතු සියළුම අදාල නිලධාරින්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියෙන්ද ලබා ගත හැකිය.

**සැ.යු. : මෙම චක්‍රලේඛයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.**

යූ. ඒ. එස්. එච්. සිසිර කුමාර
**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන)II**
**ලේකම් වෙනුවට**
**සෞඛ්‍ය අමාත්‍යාංශය**

**යූ.ඒ.එස්. හර්ෂප්‍රිය සිසිර කුමාර**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 02**
**සෞඛ්‍ය අමාත්‍යාංශය,**
**"සුවසිරිපාය"**
**කොළඹ 10**

පිටපත් -

| | |
|---|---|
| 1. නි.අ.ජ ( අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ) | - අ.ක.ස. |
| 2. අධ්‍යක්ෂ (පාලන) I | - අ.ක.ස. |
| 3. අධ්‍යක්ෂ (හෙද පාලන) II | - අ.ක.ස. |
| 4. අධ්‍යක්ෂ (හෙද අධ්‍යාපන) | - අ.ක.ස. |
| 5. අධ්‍යක්ෂ (හෙද වෛද්‍ය සේවා) | - අ.ක.ස. |
| 6. අධ්‍යක්ෂ (පාලන) V | - අ.ක.ස. |
| 7. ත්‍රිවිධ හමුදාපතිවරුන් | - අ.ක.ස. |
| 8.ආයුර්වේද කොමසාරිස් | - අ.ක.ස. |
| 9.සියලුම හෙද විදුහල්පතිවරුන්ට | - 2021/02/21 වන දින මෙම විභාග සඳහා ශාලා වෙන් කිරීම සඳහා. |

**EXI**

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා |
|---|
| |

## ආදර්ශ අයදුම්පත

**<u>සෞඛ්‍ය සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2020 (2 වාරය)</u>**

01. (අ) (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) : ..........................................................................

..........................................................................................................

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

(iii) මුලකුරු සමඟ නම (සිංහලෙන්) : ..........................................................................

..........................................................................................................

(iv) මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

(ආ) I. සෞඛ්‍ය නිලධාරිණී III ශ්‍රේණියට පත්වූ දිනය : ..........................................................................

II දැනට ලබන වාර්ෂික වැටුප : ..........................................................................

III ජංගම දුරකථන අංකය :

IV ජාතික හැඳුනුම්පත් අංකය :

02. ඔබ මෙවර පෙනී සිටීමට බලාපොරොත්තු විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුළ (√) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (×) ලකුණ යොදන්න.

ආයතන සංග්‍රහය ☐ මුදල් රෙගුලාසි ☐

03. (අ) දැනට සේවය කරන ආයතනය : (සිංහලෙන්) ..........................................................................

:(ඉංග්‍රීසියෙන්) ..........................................................................

(ආ) එය අයත් දිස්ත්‍රික්කය : ..........................................................................

(ඇ) මෙම ආයතනය අයත් වන්නේ - රේඛීය අමාත්‍යංශයට ☐

- පළාත් සභාවට ☐

(ඈ) පළාත් සභාවේ නම් අදාල පළාත : ..........................................................................

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" X 4" ප්‍රමාණයේ රු 45.00 ක මුද්දර ඇලවූ ලියුම් කවර 02ක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද? ..........................................................................

(ඊ) (i) තැපැල් ලිපිනය (සිංහලෙන්)..........................................................................

..........................................................................................................

(ii) තැපැල් ලිපිනය ( ඉංග්‍රීසි කැපිටල් අකුරින් ):..........................................................................

..........................................................................................................

04. විභාගයට පෙනී සිටින මාධ්‍යය ( සිංහල / දෙමළ / ඉංග්‍රීසි ) : ..........................................................................

EXI

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද ? ..............................................................................

(ආ ) අයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථම වරට නොවේ නම් මුද්දර අලවා තිබේද ? ..........................................

| මුද්දර කොටුව |
|---|

---

06. **අයදුම්කරුගේ සහතිකය**

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(I) මෙම අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/ප්‍රථම වතාවට නොවන බැවින් රු. ....................... ක් වටිනා මුද්දර අලවා ඇති බවත්* මෙම අයදුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගුවූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(II) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීති වලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මාගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

දිනය ....................................

.......................................................................

අයදුම්කරුගේ අත්සන

---

07. **විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරිණියගේ සහතිකය**

........................................................................................................................ මහතා/මිය/මෙනවිය*III වන ශ්‍රේණියේ හෙද නිලධාරිණියක / නිලධාරියෙකු වශයෙන් මගේ අංශයේ සේවයේ කරන බව සහතික කරමි.

දිනය ..................................

.......................................................................

විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරිණියගේ අත්සන

(මුද්‍රාව තැබිය යුතුය)

---

08. **පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ / නිලධාරිණියගේ සහතිකය**

අයදුම්පත් බාර ගන්න අවසාන දිනයට පෙර අයදුම්පත මා වෙත බාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

දිනය ..................................

.......................................

නම සහ අත්සන

---

09. **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

........................................................................... මහතා/මිය/මෙනවිය* ...........................................................

නිලධාරියකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත්, මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බවත් / ප්‍රථම වතාවට නොවන බවත් රු .............. ක් වටිනා මුද්දර මෙම අයදුම් පත්‍රයට අලවා ඇති බවද/ මුද්දර ඇලවීමට අනවශ්‍ය බවද* අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට* සුදුසුකම් ඇති බවත් මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් සහතික කරමි.

දිනය ..................................

.......................................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

(මුද්‍රාව තැබිය යුතුය)

---

10. **විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය**

.........................................................මහතා / මහත්මිය / මෙනවිය III වන ශ්‍රේණියේ හෙද නිලධාරිණියෙකු / නිලධාරියෙකු වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට / ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

.......................................................................

දිනය .................................. විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන